**ශීර්ෂය 211 රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන් දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 22 දින ගණන් දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

--------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2015 දී රුපියල් මිලියන 2,200 කට තක්සේරු කර තිබූ, සමාලෝචිත වර්ෂයේ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුවට අයිතිය පවරා තිබුණු කොළඹ 08 පිහිටි ඉඩමෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී මෙම ඉඩම තක්සේරු කර රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වත්කමක් ලෙස ලේඛනගත කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | මෙම ඉඩම වත්කමක් ලෙස ගිණුම්ගත කිරීමට කඩිනමින් ක්‍රියාකළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂකගේ 2021 සැප්තැම්බර් 21 දිනැති අංක PED/RED/WO/2021/30 දරන ලිපිය ප්‍රකාරව 2009 | අප විසින් ඒ සඳහා අදාළ ආයතන වෙත එම හිඟ ශේෂයන් ගෙවන ලෙසට ලිපි යොමු කර අදාළ ආයතනය දැනුවත් කර ඇත. | මෙම හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට වැඩ පිළිවෙලක් සකස්කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල රු.81,019,843 ක හිඟ ආදායම් ශේෂ පසු විපරම් කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන නොතිබුණි. | | |
| (ආ) | 2010 වර්ෂයේ සිට 2019 දක්වා කාලයට අදාළ රු.183,394,346 ක හිඟ ආදායමෙන් සියයට 14 ක් හෙවත් රු.25,180,698 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණි. | 2019 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලයට අදාළ හිඟ ආදායමෙන් රු.25,180,698 ක් පමණ අයකරගෙන ඇති අතර , ඉතිරිය ලබාදෙන ලෙසට අවස්ථා ගණනාවකදී අදාළ ආයතන වෙත සිහිකැඳවීමේ ලිපි සහ දුරකථන ඇමතුම් මඟින් දැනුවත් කර ඇත. ඒ තුළින් 2022 මැයි 19 දිනට තවදුරටත් රු.2,665,486 ක් එකතු කර ගැනීමට ද හැකි වී ඇත. | මෙම හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට වැඩ පිළිවෙලක් යෙදිය යුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන දහතුනක ණය ශේෂය රු.106,582,048 ක් වුවද එම ආයතන වලින් ලැබුණු ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය රු.58,638,104 ක් වූයෙන් වෙනස රු.47,943,944 ක් විය. | දෙපාර්තමේන්තු ගිණුම් පොත් අනුව ආයතන 11 ක ශේෂය රු.40,971,314 ක් බවත්, එම ආයතන මඟින් තහවුරු කර එවා ඇති ශේෂය රු.15,105,332 ක් බවත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව මඟින් දක්වා ඇත. එම වාර්තාවෙහි සඳහන් ආයතන අතරින් නාමිකව සඳහන් කර ඇති ආයතන 4 තුළ ඇති එක් ආයතනයක් වන රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව මඟින් ඔවුන්ගේ ශේෂය අප වෙත තහවුරු කිරීමක් සිදු කර නොමැත. | අදාළ ආයතන සමඟ සාකච්ඡා කොට ශේෂ නිරවුල් කරගත යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණකාධිකාරීගේ ... | |
|---|---|---|---|

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2017 නොවැම්බර් 07 දිනැති අංක 22/99 (XXXIII) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.3 ඡේදය | ගමනාන්ත දෙක අතර කිලෝමීටර් 50 ඉක්මවන ගමනාන්ත 06 ක් සඳහා නිලධාරීන් ප්‍රවාහනයට දෙපාර්තමේන්තු වාහන යොදා ගෙන කිලෝමීටර් 20,453 ක් ධාවනයකර තිබූ බවට මාස හතරක ධාවන සටහන් පරීක්ෂාවේදී අනාවරණය විය. | මේ සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ අනුමැතිය හා උපදෙස් සඳහා යොමු කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියදි පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂයේදී සිදු කළ කඩදාසි ප්‍රසම්පාදනයට අදාළ කඩදාසි තොග නිශ්කාෂණය කිරීමේදී අවස්ථා හතරකදී රු.519,671 ක ප්‍රමාද ගාස්තු හා දඩ ගෙවීමට සිදු වී තිබුණි. | භාණ්ඩාගාරයෙන් මුදල් ලැබීම් ප්‍රමාද වීම නිසා භාණ්ඩ නිෂ්කාශණය ප්‍රමාද වු බැවින් මෙම තත්ත්වය ඇති විය. | ප්‍රසම්පාදන කටයුතු මනාව සැලසුම් කිරීමෙන් ප්‍රමාද ගාස්තු හා දඩ ගෙවීමට සිදු වීම වළක්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය අනුව වටිනාකම රු. 500,000 ඉක්මවන භාණ්ඩ සහ සේවා ප්‍රසම්පාදනයේදී ලිඛිත ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී සිදු කළ ප්‍රසම්පාදන කටයුතු වලදී එලෙස කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට අනිවාර්යයෙන්ම සිදු කරන බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | අනාගතයේ වඩා ප්‍රතිචාර සහිත තරඟකාරී ලංසු ඉදිරිපත් කරන ලෙස ලංසුකරුවන් දැනුවත් කිරීමට සහ පැමිණිලි අවම කිරීම, අවංකභාවය සහ විනිවිදභාවය පිළිබඳ ප්‍රතිපත්තිය සහ පරිචය පෙන්වීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.8 වගන්තිය අනුව අසාර්ථක වූ ලංසුකරුවන්ගේ අඩුලුහුඩුතා සංෂිප්තව දැක්වීමට ප්‍රසම්පාදනයන් හිදී කටයුතු කර නොතිබුණි. | අදාළ පාර්ශවයන්ගේ ඉල්ලීම් ලද විට එම කරුණු ලබාදීම සිදු කරයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.8 වගන්තිය අනුව ක්‍රියා කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනිමේ පනතේ 460 පරිච්ඡේදයේ 44 වගන්තිය යටතේ කතරගම ප්‍රාදේශීය ලේකම් මුද්‍රණ දෙපාර්තමේන්තුවට 2003 ජනවාරි 31 දින පවරා තිබු හෙක්ටයාර් 0.105 ක් වු ඉඩම රජයේ මුද්‍රණාලිය සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය වෙත බදු කාලය අවසන් වීමෙන් පසු ද පරිහරණය සඳහා ලබා දී තිබුණි. | 2004.12.01 දින සිට වර්ෂ 10 කට ඔප්පු අංක 311 යටතේ, රජයේ මුද්‍රණාලයාධිපති විසින්, මෙම ඉඩම සමිතිය වෙත බදු ලබා දී ඇත. බදු ගිවිසුම් කාලය අවසන් වුවද වර්තමානය වන විට සමිතිය විසින් රජයේ මුද්‍රණාලයාධිපතිගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම ඉඩමේ නිවාඩු නිකේතනයක් ඉදිකිරීම සඳහා කටයුතු කරමින් පවති. | රජය සතු වත්කම් පුද්ගලික පාර්ශවයන්ට පැවරීම නොකළ යුතුය. |
| (ආ) | 2003 වර්ෂයේදී කතරගම ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුවට පවරා දී තිබූ විශාලත්වය හෙක්ටයාර් 0.105 ක් වු කතරගම පිහිටි ඉඩම තක්සේරු කර එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | කතරගම පිහිටි මෙම ඉඩම තක්සේරු කර ඉදිරියේදී රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වත්කමක් ලෙස ලේඛනගත කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | මෙම ඉඩම වත්කමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1997 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 97/5232/17/035 පරිදි 1998 වර්ෂයේ සිට වානිජ මුද්‍රණ දිමනාව දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්ට ගෙවනු ලබන අතර එක් මාසයක වානිජ මුද්‍රණ ඇනවුමෙහි වටිනාකම ස්ථාවරව පවතින ලෙස පාදක මුදල වන රු. මිලියන 40ට අනුපාත කර වානිජ මුද්‍රණ දීමනාව ගෙවනු ලැබේ. 1998 වර්ෂයේ සිට වර්තමානය දක්වා රටේ පවතින උද්ධමනය, රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම යන සාධක සැලකිල්ලට ගෙන එම රු. මිලියන 40 පාදක මුදල වැඩි කිරිමට කටයුතු කර නොතිබුණි. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය වෙත ගෙවනු ලබන දීමනා ක්‍රමවේදය සරල කිරීම සඳහා වන කමිටු වාර්තාව වැටුප් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේදී වානිජ මුද්‍රණ දීමනා සම්බන්ධයෙන් තවදුරටත් සංශෝධන සිදු කිරීමට නියමිතය. | වර්තමානය තෙක් රටේ පැවති උද්දමය, රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම යන සාධක සැලකිල්ලට ගෙන එම රු. මිලියන 40 වැඩි කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වානිජ මුද්‍රණ දීමනාව ගෙවීම සඳහා පිරිවැය ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වා දීම, මුද්‍රණ කටයුතු වල නිෂ්පාදන ඵලදායිත්වය වැඩිදියුණු කිරිම සහ හඳුනාගත් ප්‍රතිපාදනයන් සහිත ව්‍යාපෘතියක් ඇති කිරිම හෝ එයට විකල්පයක් ලෙස | පිරිවැය, ඇස්තමේන්තුකරණ හා ඉන්වොයිස් මෘදුකාංගයක් මිලදී ගැනීමට උත්සහ කළ ද අපේක්ෂිත පිරිවිතර හා නොසැසඳුන හෙයින් එය අසාර්ථක විය. නිෂ්පාදන ඵලදායීතාවය නැංවීමට විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත. අත්තිකාරම් ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට | වානිජ මුද්‍රණ දීමනාව ගෙවීමේදි සපුරා ලිය යුතු බවට අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා තිබූ කොන්දේසි කඩිනමින් සපුරාලිය යුතුය. එසේම මුද්‍රණ කටයුතුවල පිරිවැයකරණ කාර්යය ගණකාධිකාරි වරයෙකු යටතට පත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අත්තිකාරම් ගිණුමක් ඇති කිරිම යන කොන්දේසි තුන 1998 වර්ෂයේ සිට සපුරා නොතිබුණි. | තීරණය වී ඇත. | |
| (ඇ) | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ESJ / T / ALLOW / 03 /012 දරන ලිපිය මඟින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන කාර්යය මණ්ඩල දීමනා 2018 වර්ෂය දක්වා පමණක් ගෙවීමට අනුමැතිය දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ කාර්යය මණ්ඩලයට ගෙවන ලද එකතුව රු.557,421,503 ක් වූ දීමනා සඳහා කිසිදු අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | 2018 වර්ෂය දක්වා සිදු කරන ලද ගෙවීම් සඳහා අනුමැතිය ලබාගෙන ඇත. | අදාළ දීමනා ගෙවීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනාරාල්ගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ) | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ආ/8/3/706/969/21 හා 2008 දෙසැම්බර් 02 දිනැති ලිපිය අනුව දැනට සේවකයෙකු ලබන වැටුපෙන් සියයට 65ක් වන දීමනාවක් 2018 වර්ෂය දක්වා ගෙවීමට අනුමත කර තිබුණි. එසේ වුවද සේවකයන්ගේ මාසික වැටුපෙන් සියයට 65 ඉක්මවා සියයට 104 සිට සියයට 555 ක් දක්වා විවිධ වර්ගයේ දිමනා වර්ග 19 ක් ගෙවන බව දෙපාර්තමේන්තුවේ අංශ | මේ වන විට විවිධ නම් වලින් දීමනා හැඳින්වීමෙන් වැළකී පොදු ක්‍රමවේදයන් හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී. | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අදාළ ලිපියේ සඳහන් කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙකක සිදුකළ විගණන පරික්ෂාවකදි අනාවරණය විය. සමාලෝචිත වර්ෂයේදී රු.30,372,909 ක දීමනාවක් එම අංශ දෙක සඳහා ගෙවා තිබුණි. | | |
| (ඉ) | 1981 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව දෙපාර්තමේන්තුවේ හදිසි මුද්‍රණ කාර්යයන් කඩිනමින් කිරීමට අතිකාල දීමනා වෙනුවට වැඩ කොටස් අනුව ගෙවීමේ ක්‍රමයකට අනුමැතිය ලැබී තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයට වර්ෂ 40 ක් ගතවී තිබුණ ද කැලී පදනම මත දීමනා ගෙවිය යුතු වැඩ කොටස් සහ දීමනා සඳහා ගෙවිය යුතු රේටයන් නිවැරදිව හඳුනා නොගෙන එකම කාර්යයක් වෙනුවෙන් අතිකාල හා කැලී පදනම මත දීමනා යන දෙවර්ගයම ගෙවා තිබුණි. | මේ වන විට වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇති අතර දිරිදීමනා ගෙවීමට සකස් කර ඇති වාර්තාවේද කැලී ගණනට දීමනා හෝ අතිකාල දීමනා හෝ එක් දීමනාවක් පමණක් ලබා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවේදයක් සකස් කර ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතී. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අතිකාල දීමනා වෙනුවට වැඩ කොටස් අනුව ගෙවීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම කඩිනමින් සිදුකළ යුතුය. |
| (ඊ) | දෙපාර්තමේන්තුවේ “මල්ටි මීඩියා” අංශයේ කාර්යය මණ්ඩලය සඳහා පැමිණීමේ දීමනාව ගෙවීම සඳහා මාසයකට අවම වශයෙන් දින 16 ක් සහ උපරිම දින 22ක් සේවයට වාර්තා කළ යුතු වුවද දින 16 කට වඩා අඩුවෙන් සේවයට වාර්තා කරන ලද කාර්යය මණ්ඩල සාමාජිකයන්ට | කොවිඩ් තත්ත්වය නිසා සේවකයන් සේවයට කැඳවීම සීමා කිරීම නිසා මෙලෙස සේවයට වාර්තා කිරීමේ සීමාව නොසළකා පැමිණීමේ දීමනා ගෙවා ඇත. | මෙම අංශයේ සේවකයන්ට මෙයට අමතරව තවත් දීමනා රාශියක් ගෙවන බැවින් මෙම දීමනාව ගෙවීමේදී අදාළ කරගත යුතු යැයි දක්වා ඇති කොන්දේසිය ඉටු කරන්නේ නම් පමණක් දීමනා ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු.243,811 ක පැමිණීමේ දීමනාවක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | | |
| (උ) | “මල්ටි මීඩියා” අංශයේ එක් නිෂ්පාදන යන්ත්‍රයක නිෂ්පාදන සම්මතය (Norm) අඩු නොකර මුළු නිෂ්පාදනය මතම දීමනා ගෙවීම නිසා එම අංශයේ කාර්යය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 325,602 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ගණනය කිරීමේ දෝෂයක් නිසා මෙලෙස වැඩිපුර මුදල් ගෙවා ඇත. | මෙම දීමනා ගෙවීමේදී අදාළ කරගත යුතු යැයි දක්වා ඇති කොන්දේසි ඉටු කරන්නේ නම් පමණක් දීමනා ගෙවිය යුතුය. |
| (ඌ) | වර්ෂ 05 ත් 24 ත් අතර කාලයක සිට පවතින විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙකුගේ , වැඩ තහනම් කර ඇති නිලධාරිනියකගේ , සේවය හැර ගිය නිලධාරින් 18 දෙනෙකුගේ සහ වෙනත් හේතුන් මත සේවයෙන් ඉවත් කළ නිලධාරීන් 04 දෙනෙකුගේ රු.3,108,952 ක ණය ශේෂය නිරවුල් කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ණය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිත්‍ය පදනමට සහ වැඩ බැලීමේ පදනමට සහකාර රජයේ මුද්‍රණාලයාධිපතිවරුන් පත්කර ඇති අංශ 10 ක් සඳහා විශේෂ හේතු නොදන්වා වැඩ මූලිකවරුන් වැඩ ආවරණය කරන පදනමින් එම අංශවල සහකාර රජයේ මුද්‍රණාලයාධිපතිවරු ලෙස පත්කර සමාලෝචිත වර්ෂයේ රු.714,225 ක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි. | මුද්‍රණ කටයුතු වඩාත් කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා මෙලෙස තනතුරු ලබා දී ඇත. ආයතන සංග්‍රහයේ විධිවිධාන මත තනතුරට හිමි ආරම්භක වැටුපෙන් ¼ ක් වැඩ බැලීමේ දීමනාව ලෙස ගෙවා ඇත. | මෙලෙස අවිධිමත් පත්වීම් ලබාදිය යුතු නොවීම. |